අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை
'Isurupaya', Battaramulla, Sri Lanka
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல / My Ref. } ED/9/15/2/2/2 (සංගම් නි.)   ඔබේ අංකය / உமது இல / Your Ref. }   දිනය / திகதி / Date } 2020.01.22

චක්‍රලේඛ අංකය: 05/2020

සියලුම
පළාත් අධ්‍යාපන ලේකම්වරු,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
පාසල් ක්‍රීඩා සංගම් සභාපතිවරුන් / ලේකම්වරුන්,

## පාසල් ක්‍රීඩා ප්‍රවර්ධනය උදෙසා පාසල් ක්‍රීඩා සභාව හා පාසල් ක්‍රීඩා සංගම් යාවත්කාලීන කිරීමේ චක්‍රලේඛය

පාසල් ක්‍රීඩා සභාවේ සහ සියලු ම පාසල් ක්‍රීඩා සංගම්වල කටයුතු විනිවිදභාවයකින් යුතුව, කාර්යක්ෂමව හා ඵලදායිව කළමනාකරණය කිරීම සහ නියමිත ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. මෙම චක්‍රලේඛය 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන අතර මේ සමගම මීට පෙර මේ සම්බන්ධව නිකුත් කරනු ලැබූ සියලු චක්‍රලේඛ අවලංගු වේ.

### සාමාන්‍ය පරිපාලනය

පාසල් ක්‍රීඩා සභාව සහ සියලු පාසල් ක්‍රීඩා සංගම් හි නිල කාලය වසර දෙකක් වන අතර එම කාලය අවසානයේ පාසල් ක්‍රීඩා සංගම් හි නිලවරණ අදාල වර්ෂයේ මාර්තු 14 දිනට පෙර පවත්වා අවසන් කර එහි වාර්තාව එම වර්ෂයේ මාර්තු 21 ට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දිය යුතු අතර, ඒ අනුව පාසල් ක්‍රීඩා සභාවේ නිලවරණය අදාල වර්ෂයේ මාර්තු 31 දිනට පෙර පැවැත්විය යුතුය. එහි දී පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුවේ. පාසල් සංගම්වල නිලවරණය පවත්වන දිනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අදාළ වර්ෂයේ ජනවාරි 20 දිනට පෙර ලබාදිය යුතුය.

### පාසල් ක්‍රීඩා සභාව

- ජාතික ක්‍රීඩා සභාව හා සහයෝගීව ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමින් ක්‍රීඩා සංවර්ධනය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම හා ක්‍රීඩා කටයුතු අධීක්ෂණය හා නියාමනය.
- ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගම් ලියාපදිංචිය සිදු කිරීම, එම සංගම් සඳහා අවශ්‍ය උපදෙස් නීතිරීති පැනවීම හා ක්‍රීඩා සංගම් පාලනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- වාර්ෂිකව පාසල් ක්‍රීඩා වර්ණ ප්‍රදානෝත්සවය පවත්වා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම.
- ආසියාතික පාසල් ක්‍රීඩා සභාව හා අන්තර් ජාතික පාසල් ක්‍රීඩා සභාව සමඟ කටයුතු කරමින් ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගම් හරහා පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විදේශ තරඟ අත්දැකීම් ලබා දීමට අවශ්‍ය කරන කටයුතු සිදු කිරීම.

1. පාසල් ක්‍රීඩා සභාව නියෝජනය කරනු ලබන්නේ, එම සභාවේ ලියාපදිංචි, සක්‍රීය ලෙස පිළිගන්නා සියලු පාසල් ක්‍රීඩා සංගම් හි සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික හෝ අදාල සංගමයේ විධායක කමිටුවේ සාමාජිකයකු පමණි. (ඡන්ද අයිතිය තුන්දෙනෙකුට පමණි)

2. පාසල් ක්‍රීඩා සභාවේ නිල කාලය වසර 02ක් වේ. එසේ වුවද එහි සභාපති ධූරය නිළ බලයෙන් ම, අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) හෝ එම තනතුරේ රාජකාරී ආවරණය කරන නිලධාරියාට හිමි වන අතර, ඔහු/ ඇය ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුතුය. එම තනතුර හැර පහත දැක්වෙන තනතුරු සියල්ල නිලවරණයේදී තෝරා පත්කර ගත යුතුවේ.

| | |
|---|---|
| සභාපති | 01 |
| ලේකම් | 01 |
| භාණ්ඩාගාරික | 01 |
| නියෝජ්‍ය උප සභාපති | 01 |
| උප සභාපති | 05 |
| උප ලේකම් | 01 |
| උප භාණ්ඩාගාරික | 01 |

## පාසල් ක්‍රීඩා සංගම්

- දිවයිනේ සියලු ම පාසල්වල ක්‍රීඩක ක්‍රීඩකාවන්ට තම ක්‍රීඩා කුසලතා ඔප් නංවා ගැනීම හා සංවර්ධනය කර ගැනීම මගින් ජාතික තලයට පිවිසීමට මෙන් ම තම රට නියෝජනය කරමින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරගවලට සහභාගී වී දිවයිනට කීර්තියක් ලබාදීමට අවශ්‍ය මගපෙන්වීම හා පහසුකම් සැපයීම පාසල් ක්‍රීඩා සංගම්වල ප්‍රමුඛ වගකීම වේ. එම වගකීම ඉටු කිරීමේදී පාසල්වල අධ්‍යාපන කටයුතුවලට මෙන්ම ජාතික වැඩසටහන්, ජාතික විභාග හා ඇගයීම් ක්‍රියාවලියට බාධා නොවන පරිදි, ඒ ඒ වයස් කාණ්ඩවලට අදාල ක්‍රීඩා තරගාවලි නියමිත වසර තුල දී පවත්වා අවසන් කිරීම සිදු කළ යුතුවේ.

- සියලුම පාසල් ක්‍රීඩා සංගම් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පාසල් ක්‍රීඩා සභාවට හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා අධ්‍යක්ෂ මගින් අධ්‍යාපන ලේකම්ට සෘජුවම වගකිව යුතුය.

- සියලු ම පාසල් ක්‍රීඩා සංගම් පාසල් ක්‍රීඩා සභාවේ ලියාපදිංචිවී , අදාල වාර්ෂික ලියාපදිංචි ගාස්තුව සෑම වසරක් ආරම්භයේදී ම පාසල් ක්‍රීඩා සභාවේ භාණ්ඩාගාරික වෙත ගෙවා ලදුපතක් තබා ගත යුතුය.

1. සෑම පාසල් ක්‍රීඩා සංගමයකම නිල කාලය වසර දෙකක් අවසානයේ මාර්තු 15 දිනෙන් අවසන් වන අතර නියමිත දිනට පෙර නිලවරණය නොපවත්වන ක්‍රීඩා සංගම් අකර්මන්‍ය වූ සේ සලකා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් එම සංගම් හි නිලවරණය පැවැත්වීමට කටයුතු යොදනු ලැබේ. එසේම අකර්මන්‍ය වූ සංගම් හැර අනෙකුත් සංගම්වල සහභාගීත්වයෙන් ක්‍රීඩා සභාවේ මහා සභා රැස්වීම් පවත්වනු ලැබේ.
2. සෑම නිලවරණයක් ම අධ්‍යාපන අමාත්‍යාංශයේදී පැවැත්විය යුතු අතර, ඒ සඳහා දිනය කල් ඇතිව වෙන්කර ගත යුතුය. විශේෂ හේතුවක් මත බාහිර ස්ථානයක පවත්වන්නේ නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් අනුමැතිය සහිතව කොළඹ නගරය ආසන්නයේ සුදුසු ස්ථානයක පැවැත්විය හැකිය.

3. පාසල් ක්‍රීඩා සංගම්වල නිලවරණ සඳහා ලිපි ලියාපදිංචි තැපෑලෙන් තැපැල් කර එම ලේඛනයේ පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දිය යුතුය.

4. සියලු සංගම් වාර්ෂිකව යාවත්කාලීන කරන ලද සාමාජික නාම ලේඛනයක් පවත්වා ගත යුතු අතර, නිලවරණය සඳහා එම සියලු සාමාජිකයන් හට ලිපි ලියාපදිංචි තැපෑලෙන් තැපැල් කළ යුතුය. එම තැපැල් ලේඛණයේ පිටපතක් නිලවරණයේදී ඉදිරිපත් කළ යුතු අතර, ඒ අනුව නිලවරණය පැවැත්වීම සඳහා වාර්ෂික සාමාජික ලේඛණයේ සඳහන් සාමාජික සංඛ්‍යාවෙන් අවම වශයෙන් 1/3 ක් එම අවස්ථාවේ දී සභාවේ සිටිය යුතුය. සාමාජික සංඛ්‍යාව 300ට වඩා වැඩි අවස්ථාවකදී නියමිත සණ පූර්ණය නොමැති අවස්ථාවල මහා සභා රැස්වීම හා නිලවරණය පැවැත්වීම සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ - ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා වෙතින් අනුමැතිය ලබා ගත යුතුය.

අධ්‍යාපන අධ්‍යක්ෂ - ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකුගේ පූර්ණ අධීක්ෂණය යටතේ නිලවරණය පැවැත්විය යුතුය. එසේ නොවන නිලවරණයන් බල රහිත වේ.

5. නිලවරණය සඳහා පාසල් විදුහල්පති සහ විදුහල්පති විසින් අනුමැතිය ලබාදුන් ලිපියක් සහිතව තවත් ක්‍රීඩා භාර එක් ගුරුවරයකුට සහභාගී විය හැකිය.

ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ගුරු උපදේශකවරයකු ලෙස වෙනත් අධ්‍යාපන කොට්ඨාශ/ කලාප/ පළාත් කාර්යාල හෝ අධ්‍යාපන අමාත්‍යාංශ යන ස්ථානයන්ට අනුයුක්තව සේවය කරනු ලබන ගුරුභවතුන් ද සහභාගී වන්නේ නම් තමා වැටුප් ලබන විදුහලේ විදුහල්පතිගෙන් අනුමැතිය ලබා දුන් ලිපියක් සහිතව සහභාගී විය හැකිය.

වෙනත් පාසල්වලට අනුයුක්තව සේවය කරනු ලබන ගුරුභවතුන් ද, තමා වැටුප් ලබන විදුහලේ විදුහල්පතිගේ අනුමැතිය සහිත ලිපියක් සහිතව සහභාගී විය හැක.

6. සියලුම පාසල් සංගම් නිලවරණය පැවැත්වීමට අවසර ගැනීම සඳහා ( ලක්ෂ 10ට වැඩි මුදල් පරිහරණයක් සහිත පාසල් සංගම්) පසුගිය වසර 02 හි පිළිගත් ආයතනයක් මගින් විගණනය කරන ලද අය-වැය හා ප්‍රගති වාර්තාව සමග ඉල්ලීම් ලිපිය, අදාළ පාසල් සංගමයේ සභාපති,ලේකම්, භාණ්ඩාගාරික තිදෙනාගේම අත්සනින් ඉදිරිපත් කළ යුතුය.

7. සෑම සංගමයක ම විධායක සභාව ලෙස සභාපති, නියෝජ්‍ය සභාපති, උප සභාපති, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික, තරග ලේකම්, තාක්ෂණික නිලධාරී යන ප්‍රධාන තනතුරු පත් කළ යුතු අතර, එම සෑම සංගමයකම සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරු තුනෙන් දෙකක් එකම පාසලේ නිලධාරීන් හට දැරිය නොහැක. කිසියම් අයෙකුට එක් ධූර කාලසීමාවක් තුළ දී සංගම් දෙකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක සභාපති , ලේකම් හෝ භාණ්ඩාගාරික යන තනතුරු තුන එකවර දැරිය නොහැක. නමුත් ක්‍රියාකාරී සාමාජිකත්වය දැරීමට එයින් බාධාවක් නොවේ.

සංගමයේ නිලධාරීන් පහත සඳහන් අයගෙන් සමන්විත වන අතර ඔවුන් සියලු දෙනාම සංගමයේ විධායක සභාවද වේ.

| | |
|---|---|
| සභාපති | 01 |
| නියෝජ්‍ය සභාපති | 01 |
| උප සභාපතිවරු | 03ක් හෝ 05ක් |
| ලේකම් | 01 |
| උප ලේකම් | 01 |

| | |
|---|---|
| තරග ලේකම් | 01 |
| භාණ්ඩාගාරික | 01 |
| උප භාණ්ඩාගාරික | 01 (සංගම් වලට අවශ්‍ය නම්) |
| කාරක සභිකයන් | 05ක්/ 07ක්/ 09ක් |
| තාක්ෂණික නිලධාරී | 01 |

ඒ ඒ සංගම්වලට අභිමත පරිදි කාරක සභිකයන් සංඛ්‍යාවක් පත්කර ගත හැකිය. කෙසේ වුවද කාරක සභිකයින් සංඛ්‍යාව තීරණය කළ යුත්තේ විධායක සභාවේ සංයුතිය ඔත්තේ සංඛ්‍යාවක් වන පරිදිය.

සාමාජික සංඛ්‍යාව 400ට වැඩි නම් කාරක සභිකයන් සංඛ්‍යාව උපරිම 40කි. මෙම කාරක සභිකයන් අතරින් තරග ලේකම් තනතුර පත්කර ගත යුතුය.

මීට අමතරව සංගමයේ අභිවෘද්ධිය සඳහා අනුශාසකවරුන් එක් අයකු හෝ දෙදෙනකු පත්කර ගත හැකිය. එම පත්කර ගනු ලබන අනුශාසකවරුන් ක්ෂේත්‍රයේ අත්දැකීම් සහිත අදාල සංගමයේ අභිවෘද්ධිය සඳහා කැපවීමෙන් ක්‍රියාකරන අයවලුන් පත්කර ගැනීම සුදුසු වේ.

8. පාසල් ක්‍රීඩා සංගමයේ සභාපති තනතුර සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, III ශ්‍රේණි නිලධාරියකු පත්විය යුතුය. එසේ නොමැති අවස්ථාවල පමණක් අධ්‍යාපන අධ්‍යක්ෂ - (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) අනුමැතිය පරිදි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියේ විදුහල්පතිවරයකුට පත්විය හැකිය.

9. පාසල් ක්‍රීඩා සංගම්වල සියලු ධූරයන්ගේ නිල කාලය වසර දෙකක් පමණක් වන අතර සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු මාරු කරමින් හෝ ඉහත කුමන හෝ තනතුරු දරමින් සිටිය හැකි කාලසීමාව වසර 04කි. (මෙම තනතුරුවල වසර 04ක සේවා කාලය ගණනයේදී, කුමන හෝ හේතුවක් නිසා එම සංගමයේ කුමන හෝ තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා වැඩ ආවරණය කළ කාල සීමාව ද ඇතුලත් ව සේවා කාලය ගණනය කළ යුතුවේ.)

මෙම චක්‍රලේඛය 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වුවත් ඉහත සඳහන් තනතුරු සඳහා පසු ගිය වර්ෂ 04ක කාලය ද සලකා බැලීම සිදු කළ යුතුය.

10. එසේ වසර 4ක් අඛණ්ඩව සිටි නිලධාරියාට හෝ වසර 02ක් සේවය කර ඉවත් වූ නිලධාරියකුට නැවත එම සංගමයේ කුමන හෝ තනතුරක් සඳහා තේරී පත්විය හැක්කේ ඉහත කුමන හෝ තනතුරකින් නිලවශයෙන් ඉවත් වී වසර 02 ඉක්ම ගිය පසුව වේ. (ඔහු / ඇය කිසිදු විමර්ශනයකින් වරදකරුවකු නොවූ අයකු විය යුතුය)

11. සංගමයේ විධායක සභාව සඳහා පත්විය හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ කලාප අධ්‍යාපන කාර්යාලයක නිලධාරියකුට, රජයේ හෝ රජයේ ආධාර ලබන පාසලක නිත්‍ය සේවයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් වයස අවු. 58 හෝ ඊට අඩු ශ්‍රී ලං.අ.ප.සේ., ශ්‍රී ලං.වි.සේ., හා ශ්‍රී ලං.ගු.සේ. යන සේවාවන්ට අයත් රජයේ වැටුප් ලබන ස්ථිර සේවයට අයත් අවම වශයෙන් ඉදිරි සේවා කාලය වසර 02ක් සහිත නිලධාරියකුට, විදුහල්පතිවරුන්ට හා ගුරු භවතුන්ට පමණි. මෙම තනතුරු සඳහා විශ්‍රාමික නිලධාරීන්, අනුයුක්ත,රාජකාරී ආවරණ හෝ විශේෂ පත් කිරීම් (කොන්ත්‍රාත් පදනම මත ඇතුළුව) පත් කළ නොහැක.

12. විධායක සභාවේ සියලු තනතුරු සඳහා පත්වන නිලධාරීන් දැනට අදාළ ක්‍රීඩාවේ කිසියම් වයස් කාණ්ඩයක් සඳහා ආසන්නතම වර්ෂය තුල ජාතික තලය නියෝජනය කරමින් තරග සඳහා සහභාගී වූ පාසල් නියෝජනය කරන්නන් වීම හා ඉහත සඳහන් කළ ආයතනයන්හි සේවයේ නියුතු ක්‍රීඩා සංවර්ධනය සඳහා දායකත්වය ලබාදෙන්නන් වීම අනිවාර්ය වේ. තවද, සංගමයේ අනෙකුත් සියලු නිලධාරීන් හා සාමාජිකයන් ද අදාල සංගමය නියෝජනය කරන ක්‍රීඩාව සක්‍රීය ලෙස තම පාසලේ ක්‍රියාත්මක කරනු ලබන පාසල් නියෝජනය කරන්නන් විය යුතුය.

13. සංගමයේ කුමන හෝ තනතුරක් සඳහා පත් කරනු ලබන නිලධාරියා, එම තනතුරේ ධූරකාලය වන වසර 02 කාලසීමාව තුල මාස 06කට වැඩි විශ්‍රාම පූර්ව නිවාඩු, විදේශ නිවාඩු, අධ්‍යයන නිවාඩු හෝ කුමන හෝ තනතුරකට අනුයුක්තව හෝ වැඩ ආවරණය කිරීම සඳහා පත් කරනු ලබන්නේ නම්, ඔහු / ඇය එම තනතුරින් ඉවත් විය යුතුය.

තවද, විධායක සභාවේ හෝ සංගමයේ කුමන හෝ තනතුරක හෝ සේවය කරන සාමාජිකයකු, අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෝ වෙනත් ක්ෂේත්‍රයක තාවකාලික, වැඩ ආවරණය කරන හෝ විනය විමර්ශන හේතුවෙන් රාජකාරි අත්හිටුවා හෝ දඬුවම් ලබා ඇති හෝ සිවිල් නීතිය යටතේ වරදකරුවකු වී ඇති හෝ දේශීය/ විදේශීය ශිෂ්‍යත්වයක්/පුහුණුවක් ලබා යාම හෝ කායිකව/මානසිකව එම ධූරය දැරීමට නොහැකි සේ රෝගාතුර වීමක් හෝ සංගමයේ විධායක සභාව විසින් යෝජනා ස්ථිර කරගෙන මහ සභාවේ 2/3ක ඡන්දයකින් සම්මත කර ගැනීම හෝ අධ්‍යාපන ලේකම් හෝ ඔහු විසින් බලය පවරන අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) විසින් අකාර්යක්ෂමතාව හා අනලස් බව හෝ වෙනත් විනය විෂමාචාරයක් වාර්තා වන්නේ නම් එවැනි අවස්ථාවලදී එම හේතුවෙන් තම සාමාජිකත්වය සමග ම සංගමයේ තනතුර ද අහිමි වේ.

එවැනි අවස්ථාවක විශේෂ කාරක සභා රැස්වීමක් කැඳවා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) වෙත දැනුම් දී ඒ සඳහා වහාම නැවත පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ.

14. වසර දෙකකට වරක් සංගමයේ නිලවරණ පැවැත්වූවද, වාර්ෂිකව මහා සභා රැස්වීමක් පවත්වා විගණනයට භාජනය කරන ලද අය-වැය වාර්තාවක් සමග, සංගමයේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ඉදිරිපත් කළ යුතුවේ.

15. පාසල් ක්‍රීඩා සභාව සහ සියලු පාසල් සංගම් හි කිසියම් මහා සභා රැස්වීමකදී 2/3 ඡන්දයකින් හෝ ආයතන නීති සංග්‍රහයේ පළමු හා දෙවන උපලේඛනය අනුව හෝ මූල්‍ය රෙගුලාසි, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව මෙම තනතුරු දරණ නිලධාරියකුගේ (රාජ්‍ය සේවකයකුගේ) වැරදි සනාථ වන අවස්ථාවකදී ක්‍රීඩා සභාවේ සභාපති ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) විෂය භාර නිලධාරියාට එම නිලධාරීන් තනතුරු වලින් ඉවත් කිරීම හෝ නැවත නිලවරණයකට යාමට බලය ඇත.

16. පාසල් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරනු ලබන කලාප, දිස්ත්‍රික් , පළාත් හා ජාතික තරග සම්බන්ධයෙන් දින දර්ශනය අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ඔක්තෝබර් 01 දිනට පෙර ලබා දිය යුතුවේ. මෙසේ තම තරග දින දර්ශනය ලබා නොදෙන හෝ එම දින දර්ශනය අනුව කලින් සැලසුම් කර නොමැති තරග/ වැඩසටහන් සඳහා අනුමැතිය ලබා දෙනු නොලැබේ.

පාසල් සංගම් විසින් පවත්වනු ලබන සියලු තරග " අන්තර් පාසල් තරගාවලි " වන අතර ඒවා සමස්ත ලංකා පාසල් තරග ලෙස හැඳින්වීම නොකළ යුතුය.

17. රට නියෝජනය කරමින් පාසල් සංගමය මගින් පාසල් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සහභාගී කරවීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබාදෙනුයේ පිළිගත් ජාත්‍යන්තර තරග ලෙස පහත සඳහන් ඒවා සඳහා පමණක් බව අවධාරණය කරමි. සමස්ත ලංකා පාසල් වර්ණ ප්‍රදානයේදී ද මෙම ජාත්‍යන්තර තරගාවලි සඳහා පමණක් සහභාගී වී තිබීම, දක්ෂතා දක්වා තිබීම සලකා බලනු ලබයි.

I. ඔලිම්පික්
II. යොවුන් ඔලිම්පික්
III. ලෝක කුසලාන
IV. පොදු රාජ්‍ය මණ්ඩලීය
V. ආසියානු
VI. දකුණු ආසියානු
VII. ලෝක කණිෂ්ඨ
VIII. ලෝක යොවුන්
IX. ආසියාතික කණිෂ්ඨ
X. ආසියාතික යොවුන්
XI. අදාළ ලෝක සහ ආසියාතික මව් සංගම් මගින් පවත්වනු ලබන පිළිගත හැකි ජාත්‍යන්තර තරග
XII. ආසියානු පාසල් ක්‍රීඩා සභාව මගින් පවත්වන තරග (ASSF)
XIII. ජාත්‍යන්තර පාසල් ක්‍රීඩා සභාව මගින් පවත්වන තරග (ISSF)

18. මීට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය/ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන තරගාවලි සඳහා සිසුන් සහභාගී කිරීමට අවස්ථාව ලබාදීම සලකා බලනු ලබන අතර, ඒ සඳහා පාසල් වර්ණ ප්‍රදානය සිදු කරනු නොලැබේ. එම තරගාවලි පිළිගත් ජාත්‍යන්තර තරග ලෙස නම් නොකළ යුතු අතර ඒවා " ආරාධිත විදේශ තරග " ලෙස හැඳින්විය යුතුය.

19. සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගාවලියේ 1,2 හෝ 3 ස්ථානය ලබා ගත් පාසල් කණ්ඩායම් වල එම අවසන් තරගය නියෝජනය කළ ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ගේ වැඩිදුර විදේශීය පුහුණුව සඳහා අදාළ පාසලේ විදුහල්පතිගේ ඉල්ලීම පරිදි අවස්ථාව ලබාදෙනු ලැබේ.

20. සියලුම විදේශ තරග සඳහා ඉල්ලුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය, ක්‍රීඩා අමාත්‍යාංශය හා අදාළ පාසල් සංගමය හෝ අදාළ ක්‍රීඩාවේ ක්‍රීඩා අමාත්‍යාංශයට වග කියනු ලබන ප්‍රධාන ජාතික සංගමය විසින් අදාල පාසල් සංගමයේ එකඟතාවය මත පමණක් කළ යුතු අතර, වෙනත් පෞද්ගලික සංචාර හෝ එක් එක් ක්‍රීඩාව නමින් පවත්වාගෙන යනු ලබන විවිධ සංගම් මගින් ගෙන්වාගනු ලබන විවිධ ආරාධනා පත්‍ර අනුව අවසර ලබාදෙනු නොලැබේ.

21. යම් ක්‍රීඩාවක ජාතික සංගමයට හෝ පාසල් ක්‍රීඩා සභාවට අයත් පාසල් ක්‍රීඩා සංගමයකට අනුබද්ධිත විවිධ සංගම් හි ලෝක හෝ ආසියානු ජාත්‍යන්තර මව් සංගමයේ තරගාවලි, පුහුණු වැඩසටහන්, සංවිධාන වැඩසටහන්, උසස් විනිශ්චය පරීක්ෂණ සහභාගී වීමට අවසර ලබාදෙනුයේ එම ක්‍රීඩාව අයත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ජාතික සංගමය මගින් හෝ අදාළ ක්‍රීඩාවේ පාසල් ක්‍රීඩා සංගමය විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා පමණි.

ඔබ ක්‍රීඩා සංගමයේ සියලුම, දේශීය තරග හා විදේශීය තරග සහ වැඩසටහන් සංවිධානය සඳහා පූර්ව අනුමැතිය හා අවශ්‍ය කටයුතු කිරීමට අවසන් අනුමැතිය විධිමත් ලෙස ලබා ගැනීම

අනිවාර්ය වේ. දරුවන් හා ගුරුභවතුන් විදේශ ගතවීමේ දී, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පනවනු ලබන විධිවිධාන, චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.

අවසර ගැනීම සඳහා සභාපති, ලේකම් හෝ සභාපති විසින් බලය පවරන ලද විධායක සභාවේ සාමාජිකයකු පැමිණිය යුතුය. ( ඒ සඳහා ක්‍රීඩක / ක්‍රීඩිකාවන්, ගුරුභවතුන්, දෙමාපියන් හෝ වෙනත් බාහිර පාර්ශ්වයන් එවීමෙන් වැලකිය යුතුය.)

22. නව පාසල් ක්‍රීඩා සංගම් පාසල් ක්‍රීඩා සභාවේ ලියාපදිංචි වීමට, එම ක්‍රීඩාව පවතින පාසල් 50ක් අවම වශයෙන් තිබිය යුතු අතර එක් පළාතකින් අවම වශයෙන් පාසල් 05ක් වත් වනසේ දිවයිනේ පළාත් 09ම නියෝජනය වන පරිදි ව්‍යාප්තව පැවතිය යුතුය. (එසේ සියලු පළාත් වල පැවැත්වීමට අපහසු ක්‍රීඩා වලට අනුමැතිය ලබා දීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ, අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) සතුවේ.)

23. පාසල් වලට අනවශ්‍ය වැය බර අවම කිරීම පිණිස දිවයිනේ සියලු පාසල්, කොට්ඨාශ, කලාප, පළාත් කාර්යාල ඇතුළු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල විවිධ තනතුරු වල සේවය කරන නිලධාරින්ගෙන් ඒ ඒ ක්‍රීඩාවන්ට සුදුසුකම් සැපිරූ විනිසුරුවන්, පුහුණුකරුවන් හා තාක්ෂණික නිලධාරීන් හඳුනාගෙන ඔවුන් මගින් එම අවශ්‍යතා හැකිතාක් දුරට සපුරා ගැනීමට සියලු සංගම් කටයුතු කළ යුතුය.

පාසල් සංගම් විසින් තම ක්‍රීඩාව දිවයින පුරා ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය පුහුණුකරුවන්ට හා තරග පැවැත්වීම සඳහා අවශ්‍ය කරන සියලුම විනිසුරුවන්ට හා නිලධාරින්ට ජාතිකව හා ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් සපුරා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට තම සංගමයේ ඉදිරි අවශ්‍යතාවන් සෑම වසරකම ඔක්තෝබර් 01 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ පුහුණු අවශ්‍යතාවන් ඉදිරිපත් නොකරන සංගම් එලෙස අවශ්‍යතාවන් නොමැති සේ සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

ඒ අනුව බාහිර පුහුණුකරුවන් හා බාහිර විනිසුරුවන් සේවයේ යොදවා ගැනීම මගින් පාසල් හා දරුවන් මත යෙදෙන අමතර වැය බර අවම කිරීමට ඔබ සංගමය සතුව විධිමත් වැඩ සැලැස්මක් පැවතිය යුතු අතර ඉදිරි වසර 03 ඇතුලත දී මෙම ඉලක්ක සම්පූර්ණ කිරීමට සමත් වන්නේ නම් අප දිවයිනේ සෑම දරුවකුටම ක්‍රීඩාවක් කිරීමේ අයිතිය තහවුරු කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්ති රාමුව සාර්ථක කර ගැනීමට, මෙන්ම ඔබ ක්‍රීඩාවේ දියුණුවට ද හේතු වනු ඇත.

24. පාසල් සංගම් මගින් පවත්වන සියලුම තරග පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය. කිසියම් හේතුවක් නිසා අදාල වර්ෂයේ පැවැත්වීමට නොහැකිවන තරග හෝ වැඩසටහන් ඊලඟ වර්ෂයේ මුල් කාර්තුව තුළ අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. (සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරග වලට හා පාසල් විභාග වලට බාධා නොවන ලෙස අනුමැතිය දිය යුතුය.)

<u>කැඳවීම් ලිපි හා පැමිණීමේ ලේඛන ඉදිරිපත් කිරීම.</u>

25. විධිමත් ලෙස සභාපතිවරයා විසින් ම තම පෞද්ගලික අධීක්ෂණය යටතේ කැඳවීමේ ලිපි හා පැමිණීමේ ලේඛන නිකුත් කිරීම සිදු විය යුතුය. වාර්ෂික වැඩසටහන මගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගත් විධායක කමිටු රැස්වීම්, තරග ආදිය සඳහා සභාපතිවරයා පැමිණීමේ සහතික ලබා දිය යුතුවේ. මහ සභා රැස්වීම්, නිලවරණ ආදී, අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයකු සහභාගී වන අවස්ථාවන්හිදී එම නිලධාරියා විසින් පැමිණීමේ සහතික ලබා දීම සිදු කල යුතුවේ.

සභාපතිවරයා විසින් තම පැමිණීමේ සහතික අධ්‍යාපන අධ්‍යක්ෂ -ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා වෙතින් ලබා ගත යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත වැඩසටහන් සඳහා පමණක් මෙසේ පැමිණීමේ සහතික ලබා ගත හැකිය.

26. රාජකාරී ලේඛන - සෑම විටම සභාපති හෝ ලේකම්ගේ අත්සනින් ම රාජකාරී ලේඛන යැවීම සිදු කළ යුතුවේ. එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේද සියලු දැනුම් දීම් සිදු කරනුයේ සංගමයේ ලේකම්වරයාට වන අතර, ඒ අනුව ඔහු විසින් සභාපතිවරයා සමග සාකච්ඡාකර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුවේ.

27. නව ව්‍යවස්ථාවට අනුව සියලුම සංගම් තම නිලවරණය පැවැත්වීම සිදු කළ යුතුය. නිලවරණයට පෙර මෙම චක්‍රලේඛය අනුව සංශෝධිත, ඔබ සංගමයේ ව්‍යවස්ථාව විධායක සභාව විසින් අනුමත කර අත්සන් තබා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදීමට කටයුතු කළ යුතු බව දන්වමි.

කිසිදු පාසලක් ක්‍රීඩා සංගමයක ව්‍යවස්ථාව, මෙම චක්‍රලේඛයේ සීමාවන් උල්ලංඝනය නොවන පරිදි සකස් විය යුතු අතර, කිසියම් එවැනි ව්‍යවස්ථාමය ගැටලුවකදී අවසන් තීරණය මෙම චක්‍රලේඛය අනුව ගනු ලැබේ.

28. මෙහි සඳහන් කරුණු හා මතු සඳහන් නොවන කරුණු මෙන්ම, වැඩිදුර පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යාපන ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියාගේ තීරණය වේ.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
අධ්‍යාපන ලේකම්